# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment


මගේ අංකය / எனது இல / My No: DSD/HO/09/CBO/Pro./Training

ඔබේ අංකය / உமது இல / Your No: ..........................................

දිනය / திகதி / Date: 2025.11.19

සියළුම දිස්ත්‍රික් ලේකම් /දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂවරුන්
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

**රැකියා ඉලක්ක කර ගත් වෘත්තීය පුහුණු වැඩසටහන - 2025**

ප්‍රජා සවිබලගැන්වීමේ ජාතික වැඩසටහනට සමගාමීව අස්වැසුම හා සමෘද්ධිලාභී පවුල් වල තරුණ තරුණියන් සඳහා තෘතීයික අධ්‍යාපන හා වෘත්තීය පුහුණු කොමිෂන් සභාවේ (TVEC) අනුමැතිය යටතේ ක්‍රියාත්මක වන වෘත්තීය පුහුණු ආයතනයන්හි ලියාපදිංචි එක් එක් පාඨමාලා අතරින් NVQ Leval 3 මට්ටමේ පාඨමාලා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ විවිධ ක්ෂේත්‍ර ඔස්සේ හැදෑරීම සඳහා පහසුකම් සලසා දී ඇත.

02. එමෙන්ම විධිමත් වෘත්තීය පුහුණුවක් සහිත තරුණ තරුණියන් සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ රැකියා උත්පාදනය කිරීමේ හැකියාව සහිත අවස්ථා තවදුරටත් ඇති බව හඳුනා ගෙන ඇත. එලෙස හඳුනාගත් වෘත්තීය පුහුණු අවස්ථාවන් මඟින් සවිබලගැන්වීමේ වැඩසටහන යටතේ තෝරා ගත් පවුල්වල තරුණ තරුණියන් සඳහා අවස්ථාව ලබාදීමට ප්‍රජාමූල සංවිධාන හා ක්‍රීඩා අංශය මඟින් කටයුතු සැලසුම් කර ඇති බව කාරුණිකව දන්වමි.

03. ඒ අනුව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) සහ රජයේ සෘජු නියාමනය යටතේ ක්‍රියාත්මක වන ලියාපදිංචි වෘත්තීය පුහුණු පාඨමාලාවන් හා උසස් සහතිකපත් පාඨමාලාවන් (Advanced Certificate Course) හැදෑරීම සඳහා අවස්ථාව ලබාදීමට සැලසුම් කර ඇත.

04. ඉහත අවශ්‍යතාවයන්ට සමගාමීව රැකියා වෙළෙඳ පොළ ඉලක්ක කර ගත් වෘත්තීය පුහුණු අවස්ථාවන් සඳහා කැමැත්තක් දක්වන පහත සුදුසුකම් සහිත තරුණ තරුණියන්ට අයදුම් කිරීමට හැකියාව ඇත.

I. අස්වැසුම හෝ සමෘද්ධිලාභී පවුලක සාමාජිකයෙකුවීම
II. ප්‍රජාමූල සංවිධානයක සාමාජිකයෙකුවීම හෝ සාමාජිකයෙකුගේ දරුවෙකු වීම
III. සමෘද්ධි ප්‍රජාමූල බැංකුවේ සාමාජිකයෙකු හෝ ඔවුන්ගේ දරුවෙකුවීම
IV. වයස අවුරුදු 16 – 30 අතර අයෙකුවීම
V. අධ්‍යයන පොදු සහතිකපත් (සා පෙළ) දක්වා අධ්‍යාපනය ලැබූ අයෙකු හෝ ඊට ඉහළ සුදුසුකම් ලබා තිබීම
VI. දැනට යම් වෘත්තීය කුසලතාවයක් ඇති අදාල පාඨමාලා සඳහා උනන්දුවක් ඇති තරුණ කණ්ඩායම් RPL ( Recognition of prier learning )


1වන අදියර,4 වන මහල , සෙත්සිරිපාය , බත්තරමුල්ල. / 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல / 1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director (Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2869824 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |

05. පුහුණුලාභීන් තෝරා ගැනීම සහ ගිවිසුම් ගත වීම

I. මේ සඳහා පුහුණුලාභියා සහ ප්‍රාදේශීය ලේකම් / නම් කරන නියෝජිතයෙකු සමඟ අවබෝධතා ගිවිසුමක් (මේ වන විටත් අලෙවි අංශය මඟින් ගිවිසුම් හඳුන්වා දී ඇත) අත්සන් කළ යුතුය.

II. පුහුණුලාභියාගේ කැමැත්ත මෙන්ම රැකියා ගත කිරීමට හැකියාව ඇති පාඨමාලා තෝරා ගැනීම සඳහා සැලකිලිමත් විය යුතුය.

III. ප්‍රජා සවිබලගැන්වීමේ වැඩසටහන යටතේ තෝරා ගත් ප්‍රතිලාභී පවුල්වල සාමාජිකයින් සඳහා ප්‍රමුඛතාවය ලබා දිය යුතු වේ.

06. සුදුසු පාඨමාලාවන් හඳුනා ගැනීම සහ අධීක්ෂණ කටයුතු

I. තෝරා ගත් වෘත්තීය පුහුණු ආයතනය සමඟ ප්‍රාදේශීය ලේකම්/ නම් කරන නිලධාරියෙකු අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට කටයුතු කළ යුතු වේ.

II. මුළු පාඨමාලා ගාස්තුවෙන් 10% ක් රැඳවුම් මුදලක් රඳවා ගැනීමට කටයුතු කෙරේ. පාඨමාලාව සම්පූර්ණ කර සහතික පත්‍රය ඉදිරිපත් කළ පසු රඳවා ගත් 10%ක මුදල නැවත ගෙවීම සිදු කෙරේ.

III. පුහුණුලාභීන් සාර්ථක ලෙස පාඨමාලාව අවසන් කිරීම සහ රැකියා ගත කරන තෙක් නිරන්තර පසු විපරම් ක්‍රියාවලියක් හඳුනා ගත යුතුය.

07. ඒ අනුව දිස්ත්‍රික් මට්ටමින් හඳුනා ගත් පුහුණුලාභීන්ගේ තොරතුරු මේ සමඟ එවා ඇති ආකෘතියට අනුව 2025.12.05 දිනට පෙර samurdhimarketing@gmail.com යන විද්‍යුත් ලිපිනයට එවීමට කටයුතු කරන ලෙස දන්වන අතර, පුහුණුලාභීන්ගේ ඉල්ලීම් ලැබෙන ප්‍රමුඛතාවය අනුව ප්‍රජාමූල සංවිධාන හා ක්‍රීඩා අංශය මඟින් අදාල පාඨමාලා ගාස්තු දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් වෙත ලබාදීමට කටයුතු කෙරේ.

08. මෙය ප්‍රමුඛ කාර්යයක් සේ සලකා කටයුතු කරන ලෙස දන්වන අතර, වැඩිදුර තොරතුරු දැන ගැනීම සඳහා පහත අධ්‍යක්ෂවරුන් අමතන ලෙස වැඩිදුරටත් දන්වමි.

අධ්‍යක්ෂ (ප්‍රජාමූල සංවිධාන හා ක්‍රීඩා) - ඩබ්.පී.කල්‍යාණී මෙය - 0715 545 705
අධ්‍යක්ෂ (අලෙවි) - එම්.ජී.එස්.එස්.කිත්සිරි මයා - 0714 398 763

සී.ඩී.කළුආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත :-

01. ලේකම්, ග්‍රාමීය සංවර්ධන සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
02. අලෙවි, ප්‍රජාමූල සහ ක්ෂුද්‍රමූල්‍ය විෂය භාර දිස්ත්‍රික් කළමණාකාරුවන් - අ.ක.ස.

# රැකියා ඉලක්ක කර ගත් වෘත්තිය පුහුණු වැඩසටහන - 2025

| ප්‍රාදේශිය ලේකම් කාර්යාලය | ප්‍රජාමුල සංවිධානයේ නම | පුහුණු ලාභියාගේ නම | ලිපිනය | දුරකථන අංකය | පාඨමාලාව | PUBC අනුමත පුහුණු ආයතනයේ නම | පාඨමාලා කාලය | පාඨමාලා ගාස්තුව | රැකියා ගත කිරිම සඳහා බලාපොරොත්තු වන දිනය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |

..............................
සකස් කලේ
නම :-
තනතුර :-
දිනය :-

..............................
පරික්ෂා කලේ
නම :-
තනතුර :-
දිනය :-

..............................
අනුමත කලේ
නම :-
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ
දිනය :-